# මුහුණට මුහුණ

ශ්‍රීනාත් මද්දුමගේ ——

**අපි හැම තිස්සෙම ජනතාවගේ අදහස් වලට කන් දෙන්න සූදානම්. ඒ වගේම පහුගිය කාලයේ ඔබගේ පුවත් පතෙන්ද අපේ අඩු පාඩු පෙන්වා දුන්නා. අපි හැමතිස්සෙම උත්සාහ කරනවා ඒ වැරදි හදාගෙන ඉදිරියට යන්නට.....**




## ගුවන් විදුලියෙන් සැමට සේවයක් කිරීම අපේ අරමුණයි - නිමල් ඒකනායක

ශ්‍රීනාත්
3zzz ගුවන් විදුලිය හරහා අපේ සමාජයට විශාල මෙහෙයක් කරමින් සිටින ඔබ ආ ගමන පිළිබඳව ආවර්ජනයක් කළොත්?

නිමල්
මම මුලින්ම ඔස්ට්‍රේලියාවට පැමිණියේ 1989. ඒ කාලයේ ඉඳන්ම යම් යම් සමාජ සේවා කටයුතු කරන්න උත්සාහ ගත්තා. මම මුලින්ම පදිංචි වුණේ හොපර්ස් ක්‍රොසිං. වෙරබී වල පවුල් 7ක් වගේ තමයි හිටියේ. එයට සිංහල දෙමළ පවුත් ඇතුළත් වුණා. අපි මුලින්ම ශ්‍රී ලංකන්ස් ඔෆ් වෙරබී කියලා සමිතියක් පිහිටුවා ගත්තා. යම් යම් ප්‍රශ්න පැන නැගුණ නිසා එම සංවිධානයෙන් දෙමළ පවුල් ටික වෙන්ව ගියා. නමුත් මට අවශ්‍යතාවක් තිබුණා වෙරබී ව සිංහල පාසලක් පටන් ගන්න. 1993 දී අපි සිංහල පාසල පටන් ගත්තා.ගාමිණි පෙරේරා සාහ ස්කැට්ස් සංගමය මේකට මූලික වුණා. අපේ පාසල ටිකක් අඩපණ වුණත් මේ වන විට වෙරබී සිංහල පාසල හොඳට පවත්වාගෙන යනවා.

ශ්‍රීනාත්
ඔබ ස්කැට්ස් ස්විධානයට බැඳුණේ මොන අවුරුද්දෙද?

නිමල්
1993 දී බැඳිලා මට මතක හැටිය 1996/87 වසර වල එහි ලේකම් තනතුර දැරුවා. ඊට පස්සෙ ස්පර් සංවිධානයට බැඳීලා වැඩ කළා.

ශ්‍රීනාත්
මුලින්ම ගුවන් විදුලියට සම්බනධ වුණේ කොහොම ද?

නිමල්
මුලින්ම ගුවන් විදුලියට ළමා වඅඩ සටහනක් කරන්න ආනන්ද කුමාරසිංහ ගෙන් ආරාධනාවක් ලැබුණා. ඒ 93/94 වසර වල දී. මේ ළමා වැඩසටහනට මූලික වෙලා වැඩ කළේ නලිනි සහ සීතා කුලසේකර. මම මේ අයට මෙම වැඩ සටහන කරගෙන යන්න සහය වුණා. ගුවන් විදුලියට සම්බන්ධව නොවෙයි. පරිබාහිර වැඩ වලින්.

ශ්‍රීනාත්
3ZZZ ගුවන් විදුලියට සමබන්ධ වුණේ කොහොමද?

නිමල්
2002 වර්ෂයේ දී මට ගුවන් විදුලියේ කැඳවුම් කරු වෙන්න අවස්ථාව ලැබුණා. මේ වෙලාවේදී මට සැහෙන පිරිසක් උදව් කළා. නිමල් ජයලත් ආනන්ද සිරිපාල විජය රත්නායක විජය කරුණාසේන හිමාලි කරුණාසේන ඔල්ගා මෙන්ඩිස් මතක් කරන්න ඕනෙ. ඉන් පස්සෙ 2006 වසරේදී නැවත වාරයක් මම කැඳවුම්කරු වුණා. මේ වෙලාවේ උප කැඳවුම් කරු ලෙස විල්ෆ්‍රඩ් සිරිවර්ධනත් කමිටු සාමාජිකයන් වන සරත් වික්‍රමසිංහ ධර්මසිරි ජයසිංහ දයාසෝම බමුණුසිංහ සුනිල් පුෂ්පසිරි රාජා ද අල්විස් වෙලින්ටන් මොල්ලි-ගොඩ සාලිය ගලප්පත්ති සුසන්ත තෙන්නකෝන් යන අය සමග දැන් අපි ගුවන් විදුලිය කරගෙන යනවා. අපට උදව් කරන තව බොහෝ දෙනෙක් ඉන්නවා.

ශ්‍රීනාත්
ඔබට ලැබෙන ජනතා සහයෝගය කොහොමද?
නිමල්
ඉතා ආඩම්බරයෙන් කියන්න කැමතියි ජනතාවගෙන් විශාල සහයක් ලැබෙනවා. ඒකට හොඳම උදාහරණය තමයි මේ වරේදී සහ ගිය වසරේදී රේඩියෝ තෝනයට ලැබුණ ආධාර. අපි තමයි වැඩිම මුදලත් රේඩියෝ තෝනයෙන් එකතු කළේ. ඒ ජනතාවගේ මුදල්. ඒ අය මුදල් දෙන්නෙ අපි කරන වැඩේ අගැයීමට ලක් කරන නිසයි කියලා මම හිතනවා. මේ ලැබුණ ආධා ර නිසා එහි ප්‍රතිඵලයක් වශයෙන් අපට අපේ ගුවන් කාලය වැඩි කරගන්නට පුලුවන් වුණා. ඒ අනුව සෙනසුරාදාත් බ්‍රහස්පතින්දාත් ඉරිදාත් අපට ලැබී තිබෙනවා. බ්‍රහස්පතින්දා දැන් රාත්‍රී 11 සිට ආරම්භ කරන්න හැකි වෙලා තිබෙනවා.
මෙපමණ ගුවන් කාලයක් තියා ගන්න අපහසුයි. ඉස්සර වගේ නෙවෙයි. දැන් බොහෝ අලුත් රටවල සංක්‍රමණිකයන් මෙහෙ ඇවිත් ඔවුනුත් ගුවන් කාල ලබා ගන්න උත්සාහ කරනවා. ඒ කෙසේ වෙතත් ඒ සියලු බාධක මගහැරගන්නට පුලුවන් වෙලා තියෙන්නේ අපේ ශ්‍රී ලාංකික ජනතාවගේ සහය නිසයි.
ඒ එක්කම මේ වසරේ අපට ගුවන් ටිකට් පත් කීපයකුත් රේඩියෝ තෝනයට මුදල් ලබා දුන් අය අතරින් තිදෙනෙකුට කුසත් ඇදීමෙන් ලබා දෙන්න අපට හැකි වුණා. එම ටිකට් පත් ද ලැබුණේ අපට අනුග්‍රහය දක්වන අපේ හිතවතුන්ගෙන්.

ශ්‍රීනාත්
ඔබේ ගුවන් විදුලි කණ්ඩායමේ අරමුණ කුමක් ද?
නිමල්
අපේ කණ්ඩායමේ ප්‍රධාන අරමුණ තමයි සමබරතාව රැකගෙන ඉදිරියට යාම. ඒ වගේම දේශපාලන ජාති ආගම් බේධ කිසිවක් නැතිව සැමටම අදහස් ප්‍රකාශ කිරීමේ ඉඩක් ලබා දෙන්න අපි උත්සාහ කරනවා. මෙහි තිබෙන සමාජ සේවා සංවිධාන සියල්ලටම එක සේ ඉඩ ප්‍රස්ථාව ලබා දෙනවා. අප අතර පෞද්ගලික දේශපාලන මතවාද තිබුණත් එය පසු පසට දමා සමාජයට යහපත් ගුවන් විදුලියක් දෙන්න අපි වෑයම් කරනවා.

ශ්‍රීනාත්
ගුවන් විදුලියේ ඉදිරි සැළසුම් මොනවාද?

නිමල්
අපේ මූලික සැළැස්ම තමයි තරුණ තරුණියන් දිරි ගැන්වීමේ වැඩසටහන් කිරීම සහ ඔවුනට අවස්ථාව ලබා දීම. බ්‍රහස්පතින්දා ගුවන් විදුලිය මෙයට යොමු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ එක්කම සෙනසුරාදා ගුවන් විදුලිය සමාජ සුබසාධන කටයුතු කලා කටයුතු සහ නීතිය පිළිබඳව වෙන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඉරිදා ගුවන් විදුලියේ කාලය අඩු වුණත් එතුළින් සැමට අවස්ථාවක් ලබා දෙන්න අපි උත්සාහ කරනවා.

ශ්‍රීනාත්
ඔබගේ ගුවන් විදුලියට යම් අදහසක් දෙන්න යමෙකුට අවශ්‍ය නම්?

නිමල්
අපි හැම තිස්සෙම ජනතාවගේ අදහස් වලට කන් දෙන්න සූදානම්. ඒ වගේම පහුගිය කාලයේ ඔබ-ගේ පුවත් පතෙන්ද අපේ අඩු පාඩු පෙන්වා දුන්නා. අපි හැමතිස්සෙම උත්සාහ කරනවා ඒ වැරදි හදාගෙන ඉදිරියට යන්නට. ඒ එක්කම මම සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා අපට හොඳ ගමනක් යන්න අපත් සමග එකතු වෙලා අපට ඔබේ අදහස් එවන්නයි කියලා. බොහෝ වෙලාවට වෙන අපහසුතාවයක් තමයි ඉරිදා පැය දෙකක ගුවන් කාලය හැමෝම බලාපොරොත්තු වීම. සමහර විටෙක මේ නිසා කෙනෙකුට ඉඩක් ලබා දෙන්න නොහැකි වන අවස්ථාත් තියෙනවා. ඒ ගැන අපි කණගාටු වෙනවා.
අපේ දුරකතන අංක 9415 1923 ෆැක්ස් 9417 1670
ඊමේල් sinhala.radio3zzz@yahoo.com.au
ඒ එක්කම නම් වශයෙන් කියන්න බැරි වුණත් අපට උදව් උපකාර කරන සියලුම හිතවතුනට අපේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරන්නත් මම කැමතියි

ශ්‍රීනාත්
මෙල්බන් ගුවන් විදුලි සේවාන් අතරින් පැරණිම ගුවන් විදුල සේවාව වන 3zzz ගුවන් විදුලිය සාර්ථකව මෙහෙයවමින් ඉදිරියට ගෙන යන ඔබට අපේ සුබපැතුම් පිළිගන්වනවා.

ඡායාරූප - ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

### ශ්‍රී ලංකා මෝනිං ෂෝ
### වැඩසටහනට සන්නසේ සහෝදරාත්මක සුබ පැතුම්.!

චැනල් 31 රූපවාහිනී සේවයේ වසරේ හොඳම ප්‍රජා රූපවාහිනී වැඩසටහන ලෙස සම්මානයට පාත්‍ර වූ ශ්‍රී ලංකා මෝනිං ෂෝ වැඩසටහනටත් එහි නිශ්පාදක නිමල් අල්විස් මහතා ඇතුලු ඔහුගේ කාර්ය මණ්ඩලයටත් සන්නසේ සහෝදරාත්මක සුබ පැතුම් ....!




රංජිත් රූබි සමඟ පැය තුනක්
විනෝදය සහ
නැවුම් ගීත සමගින්
සෑම ඉරිදාවකම
රාත්‍රී 8 ට හමුවෙමු

Voice of Lanka
97.7FM 3SER

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්
- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists
ALL YOUR PRINTING NEEDS....
ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න
මුද්‍රණ ඇණවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත
LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243